# හැඳින්වීම

බිත්තර ප්‍රෝටීන මේදය විටමින් හා ඛනිජ ලවණ වලින් අනූන ඉතාමත් ඉහළ පෝෂදායී ආහාරයකි.ශ්‍රී ලංකාවේ දිනෙන් දිනම ඉහළ යන බිත්තර ඉල්ලුමට අවශ්‍ය බිත්තර නිෂ්පාදනය අප කරනු ලැබේ.මේ සඳහා මහා පරිමාණ ගොවිපලවල් පවත්වාගෙන යනු ලැබේ.අප ඒවා සියල්ලක්ම පාහේ පරිසර තත්ත්වයන් පාලනය කළ නොහැකි විවෘත කොටු වන නිසා මුල සිටම අප වඩා වැඩි අවධානයක් යොමු කරමින් කුකුළු පාලනය සිදු කරයි.

නිරන්තරයෙන් අලුත්වන ලෝකයේ නවීන තාක්ෂණය තුලින් පාලන ක්‍රම සහ විධි භාවිතා කිරිමට අප උනන්දු විය යුතු අතර සෞඛ්‍ය සම්පන්න බිත්තර නිෂ්පාදනයක් ලබා ගැනීමට අප හට ඇති හැකියාව ඉතා විශාලය.

පින්නලන්ද සත්ව සෞඛ්‍ය අංශ ලෙස අප දශක ගනනක් මුළුල්ලේ ශ්‍රී ලාංකීක කුකුල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉදිරියට පැමිණි ඇත. නවීන තාක්ෂණික දැනුම අප සතුය. පාරිභෝගිකයන් වෙත සෞඛ්‍ය සම්පන්න බිත්තරයක් ලබා දීම අරමුණ වේ.

# පටුන

පිටුව

භූමිය හා කොටුව සකස් කිරීම (Preparation of land and cage) 03

පැටව් අවධිය (Brooding) 04

පැටව් පාලනය (Starting) 06

වර්ධන අවධියේදී පාලනය (Growing) 08

බිත්තර නිෂ්පාදන අවධියේදී පාලනය (Laying) 10

එන්නත්කරණය (Vaccination) 14

සතුන් ඉවත්කළ පසු නැවත සතුන් දැමීම සඳහා කොටු පිළියෙල කරන ආකාරය ( Cleaning and Disinfection) 16

# භූමිය හා කොටුව සකසා ගැනීම
# (Preperation of the land and cage)

**භූමිය සකසා ගැනීම**

- භූමිය එළිපෙහෙලි කොට පිරිසිදු කිරීම.
- මුළු ඉඩමම ආවරණය වන පරිදි තාප්පයකින් හෝ කුඩා සිදුරු සහිත දැලකින් ආවරණය කිරීම.
- නිදහසේ ජලය බැසයෑමට අවශ්‍ය කාණු සැකසීම.
- මිනිසුන් හා සතුන් නිදහසේ ඉඩම තුළට පැමිණීම වැලැක්වීම.
- සුළං හැමීමට ඇති බාධාවන් ඉවත් කිරීම.

**කොටුව සකසා ගැනීම**

- දිශානතිය - නැගෙනහිර - බටහිර දිශාවට පළල පැත්ත මුහුණලා
- දිග - සීමාවක් නොමැත.
- පළල - අඩි 16 ත් 24 ත් අතර.
- වැඩුණු සතෙකුට අවශ්‍ය දළ ඉඩ ප්‍රමාණය :
  සුදු සතෙකුට - වර්ග අඩි 1.8
  දුඹුරු සතෙකුට - වර්ග අඩි 2
- කොටු සෑදීමේදී සෑමවිටම මාර්ගවලට ඈතින් සෑදිය යුතුය.
- කොටු අතර පරතරය අවම වශයෙන් අඩි 20 ක් තිබිය යුතුය.
- වහලය - ආලෝකය පරාවර්තනය වන තහඩු , පොල් අතු හෝ වෙනත් සෙවිලි ද්‍රව්‍ය.
- පොළොව කොන්ක්‍රීට් කර ගැනීම වැදගත්ය.
- කොටුව කොටස් වලට වෙන් කර ගැනීම. (Partitioning) වැදගත් වන අතර එක් එක් කොටසට පිවිසීමට වෙන වෙනම දොරවල් තිබිය යුතුය.
- එක් එක් කොටුවල සියලුම දොරවල් සඳහා වෙන වෙනම විෂබීජ නාශක (Disinfectant) යෙදූ පා දෝවන අනිවාර්‍ය අතර පිටතින් පැමිණෙන වාහන සේදීමද කළ හැකි නම් ඉතා වැදගත්ය.

# පැටවී අවධිය (Brooding)

(වයස දින 7 -10 ක් පමණ)
**බෲඩරය සකසා ගැනීම**

- රවුමට සකසා ගැනීම වැදගත්ය.
- අඩි 1.5ක් පමණ උස තහඩුවක් පාවිච්චි කළ හැක.
- ඉඩ ප්‍රමාණය - 1 $m^2$ ක් සතුන් 40-50 කට (අඩි 36 ක් දිග තහඩුවක් රවුම් කර ගැනීමෙන් පැටවී 500 කට අවශ්‍ය ඉඩ ප්‍රමාණයක් ලැබේ.)
- ආස්තරණය - දහයියා, ලී කුඩු ,ලි පොතු හෝ වෙනත් ආස්තරණ ද්‍රව්‍ය.
- ආස්තරණයේ ඝනකම අඟල් 2-3 ක්.

- සතුන් බෲඩරයට දැමීමට ප්‍රථම කෑම, වතුර හා උෂ්ණත්වය සැපයිය යුතුය.
- වතුර භාජන (1L/4.5L) - සතුන් 50 ට එක් භාජනයක්.
- පැතලි ආහාර භාජන (Chick tray) - සතුන් 50 ට එකක්.

**උෂ්ණත්වය සැපයිය හැකි ආකාර**

- දර භාවිතයෙන්
- පොල් කටු අඟුරු භාවිතයෙන්
- ගෑස් භාවිතයෙන්
- විදුලි බල්බ භාවිතයෙන්

- මුල් දින 3 දී ආස්තරණය මත පත්තර/ කඩදාසි ඇතිරීම සිදු කළ යුතුය.
- බෲඩරය තුළදී උතුරවා නිවාගත් ජලය පානය කිරීමට දීම වැදගත්ය.
- මුල් දිනයේදී මුල් පැය 6-12 ක් පමණ කාලයක් ග්ලූකෝස් දියකළ ජලය ලබාදීම වැදගත්ය.
- මුල් දින 4-5 ක කාලය තුළ මල්ටි විටමින් ඛනිජ ලවණ සමඟ ප්‍රතිජීවකයක් (පශු වෛද්‍යය නිර්දේශය මත) ලබා දීම සුදුසුය.
- බෲඩරය තු-ළදී චික් ස්ටාටර් (Chick starter) වර්ගයේ ආහාරයක් ලබාදිය යුතුය.
- චික් ස්ටාටර් (Chick starter) වර්ගයේ ආහාරයක පෝෂණ අගයන් :

  - දළ ප්‍රෝටීන් (Crude protein) – 20.5-21%
  - ශක්තිය (Metabolizable Energy) – 2850-2950 kcal/kg
  - කැල්සියම් (Ca) – 1%
  - පොස්පරස් (P) -0.5%

- බෲඩරය තුළ ජලය සහ ආහාර පැය 24 පුරාම ලබාදිය යුතුය.(Adlibitum Feeding)
- නිතරම දතුන් කෑමට හා බිමට උනන්දු කළ යුතුය.
- පළමු දින කිහිපයේදී බෲඩරය තුළ උෂ්ණත්වය ප්‍රශස්ත මට්ටමේ පවත්වා ගැනීම වැදගත්ය.
- උෂ්ණත්වය ලබාදිය යුතු දින ගණන පරිසර උෂ්ණත්වය සමඟ වෙනස් වේ.
- උෂ්ණත්වය ලබා දෙන කාලය තුළ පැටවුන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීමෙන් අවශ්‍ය උෂ්ණත්වය තීරණය කරගත හැකිය.
- පැටවුන් ගෙන ඒමට ප්‍රථම ආස්තරණයේ උෂ්ණත්වය 30C -32C අතර පවත්වා ගත යුතුය.
- සතියක් අවසාන වන විට බෲඩරයේ උෂ්ණත්වය 3 කිනා පමණ ක්‍රමයෙන් අඩු කල යුතු අතර පරිසර උෂ්ණත්වය මත පැටවුන් බෲඩරයේ තබන කාලය වෙනස් වේ.
- වාතාශ්‍රය සම්බන්ධයෙන්ද ඉතාමත් සැලකිලිමත් විය යුතුය.
- පිරිසිදු වාතාශ්‍රය ලබාදීම අවශ්‍ය වේ. (විශේෂයෙන් දර හා පොල්කටු අඟුරු බෲඩර් වල)
- කෑම භාජන හා වතුර භාජන දිනපතා පිරිසිදු කල යුතුය.
- වියළි ආස්තරණයක් පවත්වාගැනීම ඉතා වැදගත්ය.

- ඒකාකාර ප්‍රමාණවත් ආලෝකයක් සැපයිය යුතු අතර මුල් සතියක පමණ කාලය තුල පැය 24 ම ආලෝකය සැපයීම කළ යුතුය.
- පළමුවරට හොට කැපීම (Beak trimming) දින 8-10 ත් අතර කාලයේදී කල යුතුය.

# පැටව් පාලනය (Starting)

**දින 10 පමණ සිට සති 6 ක් දක්වා**

- ස්ටාටර් (Starter) වර්ගයේ ආහාර ලබා දේ.
- සති 6 දී අවශ්‍ය ඉඩ ප්‍රමාණය - සකෙකුට වර්ග අඩි 0.6
- මෙම අවධියේදී ලොකු කෑම භාජන ක්‍රමයෙන් හඳුන්වාදීම කළ යුතුය.
- කෑම භාජන සංඛ්‍යාව - සතුන් 40 ට 1 යි.
- මෙම අවධියේදී ලොකු වතුර භාජන (9L) සහ ස්වයංක්‍රීය වතුර භාජන (Auto drinkers) හඳුන්වාදීම සිදු කළ යුතුය.
- වතුර භජන සංඛ්‍යාව

    ස්වයංක්‍රිය (Auto) වතුර භාජන

    - සාමාන්‍ය පරිසර තත්වයන් යටතේදී සතුන් 100:1
    - අධික උෂ්ණත්වයක් සහිත දේශගුණයේදී සතුන් 80:1 මැනුවල් (Manual) වතුර භාජන
    - සාමාන්‍ය පරිසර තත්වයන් යටතේදී සතුන් 50:1
    - අධික උෂ්ණත්වයක් සහිත දේශගුණයේදී සතුන් 30:1

**වැදගත් කරුණු**

- කොක්සිඩියෝසිස් රෝගය පාලනය ඉතාම වැදගත් වන අතර ඒ සඳහා වියළි ආස්තරණයක් පවත්වා ගැනීම සහ පශු වෛද්‍ය නිර්දේශය මත කොක්සි මර්දක ඖෂධ භාවිතය සිදු කළ හැක.
- බීමට සුදුසු ජලය ලබදීම සැමවිටම කලයුතු අතර ඒ සඳහා ජලයට ජල ආම්ලිකාරක යෙදීම, ක්ලෝරින් යෙදීම (අවසාන ජලයේ 3-4 ppm) හෝ වෙනත් ජල පිරිසිදු කාරකයක් භාවිත කල හැක.
- සිසිල් ජලය ලබාදිම සඳහාජල ටැංකි සහ බට සිසිල් ස්ථානයක තැබිය යුතු අතර එසේ නොමැති නම් ඒවා ආවරණය කර තැබීම වැදගත් වේ.
- සත්ත්ව වර්ගය, පරිසර උෂ්ණත්වය සහ පාලන ක්‍රමය මත සතුන්ගේ ආහාර ගැනීම හා ශරීර බර වෙනස් විය හැක.
- හැකි සෑම විටම නියමිත ශරීර බර පවත්වා ගරනීමට කටයුතු කිරිම වැදගත් වේ.

| වයස(සති) | වයස(දින) | දළ ආහාර ප්‍රමාණය (g/bird/day) සුදු - Shaver | දළ ශරීර බර (g) සුදු -Shaver | දළ ආහාර ප්‍රමාණය (g/bird/day) දුඹුරු-Hy-line | දළ ශරීර බර (g) දුඹුරු-Hy-line |
|---|---|---|---|---|---|
| 1 | 7 | 8 | 65-70 | 14-15 | 68-72 |
| 2 | 14 | 15 | 130-135 | 17-21 | 121-129 |
| 3 | 21 | 25 | 195-205 | 23-25 | 184-196 |
| 4 | 28 | 33 | 275-285 | 27-29 | 257-273 |
| 5 | 35 | 39 | 360-375 | 34-36 | 349-371 |
| 6 | 42 | 44 | 440-460 | 38-40 | 446-474 |

## වර්ධන අවධියේදී පාලනය (Growing)

සති 6 - සති 18 පමණ දක්වා ග්‍රෝවර් (Grower) වර්ගයේ ආහාර ලබා දේ.

- ග්‍රෝවර් 1 (Grower 1) වර්ගයේ ආහාරයක පෝෂණ අගයන්

  සති 6-12 පමණ දක්වා
  - දළ ප්‍රෝටීන (Crude Protein)- 18.5% - 19%
  - ශක්තිය (Metaboli'able Energy) – 2750 – 2850kcal/kg
  - කැල්සියම් (Ca) – 1%
  - පොස්පරස් (P) – 0.45 -0.5%

  සති 12 න් පමණ පසුව ග්‍රෝවර් 2 (Grower 2) වර්ගයේ ආහාරයක් ලබාදිය හැක.

- ග්‍රෝවර් 2 වර්ගයේ ආහාරයක පෝෂණ අගයන්
  සති 12-18 පමණ දක්වා
  - දළ ප්‍රෝටීන් (Crude Protein)- 1705% - 18%
  - ශක්තිය (Metabolizable Energy)- 2700 – 2800kcal/kg
  - කැල්සියම් (Ca) - 1.1%
  - පොස්පරස් (P) - 0.45%

- ස්ටාටර් (stater) කෑම වල සිට ග්‍රෝවර් (Grower) කෑම දෙනවිට ක්‍රමයෙන් හඳුන්වාදීම සිදු කල යුතුය.
- කෑම භාජන සංඛ්‍යාව.- සතුන් 25 ට 1 යි.
- වතුර භාජන සංඛ්‍යාවන් ස්ටාටර් (starter) අවධියේදී ලබා දුන් සංඛ්‍යාවම වේ.
- මෙම අවධිය ආරම්භයේදි එක් සතෙකුට වර්ග අඩි 1 ක පමණ ඉඩ ප්‍රමාණයක් (Floor space) ලබා දිය යුතු අතර මෙම අවධිය අවසාන වන විට කොටුවේ මුළු ඉඩ ප්‍රමාණයම ලබා දීම සිදු කල යුතුය.
- සති 10 දී පමණ දෙවන වර හොට කැපීම (Beak trimming) සිදු කල යුතුය.
- වර්ධන අවධියේදී ශරීර බර නියමිත ආකාරයට පවත්වා ගැනීම ඉතාමත් වැදගත් වන අතර එය ඉදිරි කාලයේදී බිත්තරයේ ප්‍රමාණය හා බිත්තර සංඛ්‍යාවට විශාල ලෙස බලපායි.
- මෙම අවධියේ දී බර අනුව සතුන් වෙන් කළ යුතුය.
- වර්ධනය අඩු සතුන්ට වැඩිපුර කෑම සහ අතිරේක ආහාර (supplements) ලබා දීම සිදු කළ හැක.

## වැදගත් කරුණු

- එමෙන්ම මෙම අවධියේදී ( සති 06) පණු හරණය සඳහා බෙහෙත් ( ) පාවිච්චි කිරීම ආරම්භ කළ යුතු අතර සතුන්ගේ ජීවිත කාලය පුරාම මාස 1 1/2 -2 ක පරතරයකින් යුතුව පණු බෙහෙත් ලබා දීම කළ යුතුවේ.
- පනු හරණයේදී සෑම විටම අවශ්‍ය බෙහෙත් මාත්‍රාව (Recommended does)පාවිච්චි තිරීම වැදගත් වේ.
- පනු හරණයේදී එක් එක් අවස්ථාවන් සඳහා වෙනස් ආකාරයේ බෙහෙත් පාවිච්චි කිරීමද වැදගත් වේ.
- වෙනස් ආකාරයේ බෙහෙත් තෝරා ගැනීමේදි සැළකිලිමත් විය යුතු අතර ඒ සඳහා ලේබලයේ ඇති වෙළඳ නාමය නොව ක්‍රියාකාරී සංයෝගය වෙනස් බෙහෙත් තෝරා ගත යුතු වේ.

## ආලෝකය ලබා දීමේ  වැඩසටහන

**ආලෝක වැඩ සටහනක ඇති වැදගත්කම**

- සතාගේ වර්ධනය තීරණය කළ හැකි වීම
- සතුන් බිත්තර දමන වයස තීරණය කල හැකි වීම
- උපරිම බිත්තර නිෂ්පාදනයක් ලබා ගත හැකි වීම
- ණියමිත ආකාරයට බිත්තරයේ ප්‍රමාණය ඉක්මණින් ලබා ගත හැකි වීම.

## වැදගත් කරුණු

- ආලෝකය ලබා දීමේ මුල සිටම ක්‍රමවත් වැඩ සටහනක් පිලපැදිය යුතුය.
- මෙහිදී ඒකාකාර නියමිත තීව්‍රතාවයකින්  යුත් ආලෝකය ලබා දීම වැදගත් වේ.
- එමෙන්ම ආලෝක වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදී ෂතුන්ගේ නියමිත ශරීර බර හා ශරීරයේ නියමිත වර්ධනය පවත්වා ගැනිම කල යුතුය.

මෙම අවධියේදී ආස්තරනය ක්‍රමවත්ව පවත්වා ගත යුතු අකර පිරිමි සතුන් ඉවත් කිරීමද සිදු කල යුතුය.

# බිත්තර නිෂ්පාදන අවධියේදී පාලනය

# (Laying Peroid)

**සති 18 පමණ පසු**

බිත්තර 5 % පමණ ලැබෙන් විට ලේයර් වර්ගයේ ආහාරයක් ලබා දීම සිදු කල යුතුය.

ලේයර් 1 ආහාරයක පෝෂණ අගයන් : සති 18-45 පමණ

- දළ ප්‍රෝටීන (Crude Proten ) – 18%-19%
- ශක්තිය ( Metabolizable Energy) 2850-2950 kcal/kg
- කැල්සියම් (Ca) – 4%
- පොස්පරස් (P) – 0.45%

සති 45 න් පසුව ලේයර් 2 වර්ගයේ ආහාරයක් ලබා දීය හැක.

ලේයර් 2 වර්ගයේ ආහාරයක පෝෂණ අගයන් : සති 45 න් පසු

- දළ ප්‍රෝටීන (Crude Proten ) – 17%-18%
- ශක්තිය ( Metabolizable Energy) 2800-2900 kcal/kg
- කැල්සියම් (Ca) – 4.4%
- පොස්පරස් (P) – 0.45%
-

කෑම භාජන සහ වතුර භාජන සංඛ්‍යාව වර්ධන අවධියේදී මෙන් වේ.

අවශ්‍ය ඉඩ ප්‍රමාණය ( Floor Space )

- සුදු සතෙකු සඳහා- වර්ග අඩි 1.8
- දුඹුරු සතෙකු සඳහා - වර්ග අඩි 2

- කැම ලබා දිම වාර කිහිපයකින් හා නියමිත කාල පරාසයකින් සිදු කල යුතුය. (දිනකට අඩුම වාර 2ක්වත් සැපයිය යුතුය.)

- ජලය ලබා දීමට සීමාවක් නොමැත.
- මෙම අවධියේදී ෂතුන් බර අනුව වෙන් කිරීම වැදගත් වේ.
- නිවැරදි ලෙස වර්ධනය වීම සහ සති 18ක් 19 ක් අතර කාලයේ බිත්තර දැමීම පටන් ගත් සතුන් සති 26 -27 ක් පමන වන විට උපරිම නිෂ්පාදනයට ( Peak) පැමිණිය යුතුය.
- මෙම අවධියේදීද මුල සිට පවත්වා ගැනෙනු ලබන ආලෝක වැඩසටහන ක්‍රියාත්මක වීම වැදගත් වේ.
- බිත්තර දමන අවධියේදී ෂතුන් 100 කට සිප්පි කටු කැබලි 1 භාජනයක් වන සේ එල්ලා තැබිය යුතුය.
- හැකි තරම් උෂ්ණත්වය හා ආතතිය පාලනය කිරීමට කටයුතු කිරීම උපරිම බිත්තර නිෂ්පාදනයක් ලබා ගැනිමට ඉවහල් වේ.

## වැදගත් කරුණු

- පා දෝවනය සදහා දිනපතා අලුත් ජලය සහ අවශ්‍ය ප්‍රමාණයෙන් විෂබීජ නාශක (Disinfectant)
- මිශ්‍ර කළ යුතුය
- මකුළු දැල් කැඩීම වතුර හා කෑම භාජන පිරිසිදු කිරීම සහ ආස්තරණය ක්‍රමවත්ව පවත්වා ගැනිම ඉහළ බිත්තර නිෂ්පාදනයක් සඳහා උපකාරි වේ
- ජෛව ආරක්ෂණ () ක්‍රම පිළිපැදිමට සැම විටම උත්සහ කළ යුතු අතර එමගින් සතුන්ට රෝග වැළදීම අඩු කර ගැනීමටත් හැකි වේ

## උෂ්ණත්ව පාලනය

- උෂ්ණත්ව පාලනයට කල හැකි දේ
- සිසිල් ජලය ලබා දීම හා ජලය බීමට උනන්දු කරවීම
- සත්ව ඝණත්වය අඩු කිරිම
- වහලය ජලයෙන් තෙත් කිරිම
- සිසිල් ජලය කොටුව තුලට ස්ප්‍රේ කිරීම
- ආස්තරණයේ ඝනකම අඩු කිරීම
- උෂ්ණත්වය අධික වේලාවන් හිදි ආහාර පාලනය කිරීම
- කොටු සෑදීමේදී සුළගේ දිශාව කොටුවල උස සහ වහලයේ සැකැස්ම සම්බන්ධව යොමු කිරීම
- ෂතුන්ගේ ශරීර උෂ්ණත්වය ඉහළ යාමෙන් ඇති වන අසමතුලිතතාවය පාලනය සඳහා විශේෂයෙන් සකසන ලද අතිරේක ද්‍රව්‍ය ලබාදීම

උදා:- අයන (Electrolities), විටමින් සී

## වැදගත් කරුණු

උෂ්ණත්වය අධික වු විට ෂතුන්ගේ ආහාර ගැනීම අඩු වන නිසා බිත්තර නිෂ්පාදනය අඩු නොවී පවත්වා ගැනීම ස1දහා අවශ්‍ය පෝසය පදාර්ත බොන වතුර සමග ලබා දීම වැදගත් වේ.

එන්නත්කරණය (Vaccination)

එන්නත් ලබාදිය හැකි ක්‍රම

මුඛ මාර්ගයෙන් (Oral)

නාසය හරහා (Nasal)

ඇස හරහා (Ocular)

ස්ප්‍රේ කිරීම (Spray)

තටුවට විදීම (Wing web)

මසට විදීම (Intramuscular)

සම යටට විදීම (Subcutaneous)

මුඛ මාර්ගයෙන් (Oral Vaccine) එන්නතක් ලබා දෙන ආකාරය

- එන්නත් ලබාදීම හිරු එළිය නොමැති උදේ හෝ හවස් කාලයේදි කල යුතුය
- (පරිසර උෂ්ණත්වය මත මෙම පැය ගණන වෙනස් වේ.)
- සතුන් පැය 1 1/2 ක් 2ත් අතර වේලාවක් බීමට අවශ්‍ය තරම් ජලය සපයා ගත යුතුය.
- උතුරවා නිවා ගත් ජලය ජලය භාවිතා කිරීම සුදුසුය.
- එම ජලය ප්‍රමාණයට මේද රහිත කිරිපිටි හෝ එන්නත් ස්ථායිකාරක ( Vaccine Stabilizer) නියමිත ප්‍රමාණයන්ගෙන් භාවිතා කල යුතුයි.
- මේද රහිත කිරිපිටි නම් (Non fat )තේ හැදි එකක් වතුර 2L කට දමා හොඳින් දිය කර ගත යුතුය.
- මෙසේ දිය කර ගත් ද්‍රාවනය විනාඩි 15-20 ත් අතර කාලයක් තැබිය යුතුය.
- ඉන්පසු ශීතකරනයේ ඇති එන්නත් රැගෙන විත් ජලය විවෘත කර හොඳින් මිශ්‍රකර ගත යුතුය.
- එන්නතේ කාර්යක්ෂමතාව වැඩි කරගැනීම සඳහා සිසිල් ජලය භාවිතා කරන අතර අවශ්‍ය වතුර භාජන ප්‍රමාණයට එන්නත සහිත ජලය පුරවා හැකි ඉක්මණින් ලබා දීම වැදගත් වේ.

ලේයර් කිරීම සතුන් සඳහා දළ එන්නත් වැඩසටහන

දින 01 – 1B

දින 07 - රැනිකට් B1

දින 12 - ගම්බෝරෝ 1

දින 18 - ගම්බෝරෝ II

දින 24 - IB+ND

දින 28 - ගම්බෝරෝ III

සති 05 -ෆවුල් පොක්ස් I (Wing web)

සති 06 - චිකන් ඇනීමියා (IM/SC)

සති 08 - IB+ND (Oral)

සති 09 - සැල්මොනෙල්ලා (IM/SC)

සති 10 - ෆවුල් කොලෙරා (IM/SC)

සති 11 - ෆවුල් පොක්ස් II (Wing web)

සති 12 - IB+ND (Oral)

සති 15 - රැනිකට් (IM/SC)

සති 16 - සැල්මොනෙල්ලා II (IM/SC)

මරෙක්ස් රෝගය සඳහා හැචරියේදී එන්නත් කල යුතුය.

වැදගත් කරුණු

- එන්නත් වැඩ සටහන ප්‍රදේශයෙන් ප්‍රදේශයට ගොවිපලෙන් ගොවිපලට සහ කණ්ඩායමෙන් කන්ඩායමට අවශ්‍ය ආකාරයට වෙනස් කර ගත යුතුය.
- එන්නත් ලබා දීම සඳහා කිසිවිටෙකත් විෂබීජ නාශක යෙදූ ජලය හෝ විධබීජ නාශකවලින් සේදූ උපකරණ උත්තේජකයක් ලබාදීම වැදගත් වේ.

උදාඃ-විටමින් E

- සතුන් ඉවත් කළ පසු නැවත සතුන් දැමීම සඳහා කොටු පිළියෙල කරන ආකාරය (Cleaning and Disinfection)
- සතුන් ඉවත්කල වහාම උෂ්ණත්වය තිබියදිම ආස්තරණය මතට හා බිත්ති මතට කෘමිනාශකයක් (lìecticide) යෙදිය යුතුය
- පැය 24කට පමණ පසු ආස්තරණය සම්පූර්ණයෙන් ඉවත් කල යුතුය.
- ඉවත් කළ ආස්තරණය පිළිස්සීම හෝ ඉතා ඈත. : අවම 1 Km – 2Km
- ක් පමන දුර ස්ථානයකට ගෙන ගොස් දැමීම කළ යුතුය.
- සියලුම වතුර භාජන සහ කෑම භාජන ගලවා ඉවත් කළ යුතුය.
- වතුර හා කෑම භාජන සහ කෑම භාජන ක්ෂාලක (Detergent) වර්ගයකින් පිරිසිදු ජලයෙන් හා අවසානයේ විෂබීජ නාශකයකින් (Disinfectant) සෝදා ගැනීම කළ යුතුය
- පොළව දැල් හා මුළු කොටුවම පිළිවෙලින් වේගවත් පිරිසිදු ජලයෙන් ක්ෂාලක ද්‍රව්‍යයකින් පිරිසිදු ජලයෙන් හා අවසානයේ විෂබීජ නාශකයකින් දෙවතාවක්වත් කළ යුතුය

- වතුර බට පිරිසිදු කාරයකින් සහ පිරිසිදු  ජලයෙන් සෝදා ගත යුතුය
- නැවත සතුන් කාණ්ඩයට රෝග වැළඳි තිබුනේ නම් විෂබීජ නාශනය අවම වශයෙන් දෙවතාවක්වත් කළ යුතුය
- වතුර බට පිරිසිදු කාරකයකින් සහ පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතුයි.